# තනතුරු - ඇබෑර්තු

## කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් ඇති කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර පරීක්ෂක | 01 | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් 2කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>• අ.පො.ස. (උ.පෙළ,) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් 1ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br>• ක්ෂේත්‍රයට අදාළව පිළිගත් කාර්මික විද්‍යාලයකින් ලබාගත් ජාතික තාක්ෂණය (සිවිල්) පිළිබඳ සහතිකය ලබා තිබීම | රු. 27,140-10x300-11x350-10x495-10x660-රු. 45,540 (MN1-2016) | • ලිඛිත පරීක්ෂණය<br>• වෘත්තීය පරීක්ෂණය<br>• සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය |
| 02 | සෞඛ්‍ය පරීක්ෂක | 01 | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් 2කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br>• අ.පො.ස. (උ.පෙළ,) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් 1ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | රු. 27,140-10x300-11x350-10x495-10x660-රු. 45,540 (MN1-2016) | • ලිඛිත පරීක්ෂණය<br>• සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය |
| 03 | රියැදුරු | 01 | • දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 2කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 6කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.<br>• මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම හා අවම වසර 3ක පළපුරුද්ද | රු. 25,790-10x270-10x300-10x330-12x350-රු.38,990 (PL-3-2016) | • ලිඛිත පරීක්ෂණය<br>• වෘත්තීය පරීක්ෂණය<br>• සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය |
| 04 | කාර්යාල කාර්ය සහායක | 01 | • දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 2කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 6කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම. | රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410 (PL-1-2016) | • ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය |

*01. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුයි. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iii) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුයි. (ඡන්ද හිමි නාම ලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුයි.)

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

(vi) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතුයි.

(vii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතුයි.

(viii) දැනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ ස්වේච්ඡා/ස්ථිර පදනම මත සේවයේ යෙදෙන සේවකයන් සම්බන්ධයෙන් විශේෂිත සැලකීමක් දක්වනු ලැබේ.

(ix) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාල සීමාවේදී, මධ්‍යම පළාතේ මෙම තනතුරුවලට අදාළව නව බඳවා ගැනීම් පරිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීම ද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

02. *සේවා නියුක්ති කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත් වේ.

ii. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුයි.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

iv. මෙම බඳවා ගැනීම් කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද/රජයේ මුදල් රෙගුලාසිවලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද/මධ්‍යම පළාත් සභාව හෝ කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුයි.

03. *සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතුයි.*

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) ජාතික හැඳුනුම්පත් ඡායා පිටපතක්
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (මින් 01ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත යුතුය)
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතිකය

04. වෘත්තීය තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත ඇතුළත්, පහත සඳහන් පරිදි සකසා ගත් අයදුම්පතක් අදාළ සියලුම සහතිකවල පිටපත් ද සමගින් 2017.10.27 දින හෝ එදිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුයි.

05. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

06. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව එවිය යුතුය.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව,
මැණික්හින්න.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින.

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ ............................ තනතුර සඳහා අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :____________________.
   (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :____________________.
2. ස්ථිර ලිපිනය :____________________.
3. උපන් දිනය: අවුරුද්ද:______ මාසය:______ දිනය :______.
4. ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
5. ස්ත්‍රී/පුරුෂ භාවය :____________________.
6. දුරකථන අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
7. විවාහක/අවිවාහක බව :____________________.
8. අධ්‍යාපන සුදුසුකම් :____________________.

   8.1 අයදුම්කරුවන් අවසන් වරට සමත් වූ පංතිය : සිංහල :______
   දෙමළ :______

   8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය
   (i) වර්ෂය :______ මාසය :______
   (ii) විභාග අංකය :______
   (iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

   8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය
   (i) වර්ෂය :______ මාසය :______
   (ii) විභාග අංකය :______
   (iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :______
10. වෙනත් සුදුසුකම් :______
11. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ? :______

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමටද යටත්වන බව ද මම දනිමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :______

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ.......................................... තනතුර දරන ..................................................මයා/මෙනවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

____________________,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :__________